ලේකම් / செயலாளர் / Secretary
දූරකථනය / தொலைபேசி / Telephone: 2449959
ෆැක්ස් අංකය / பெக்ஸ் இல. / Fax No.: 2445447
E-Mail: secretary@moj.gov.lk

ප්‍රධාන කාර්යාලය / பொது அலுவலகம் / General Office
දූරකථනය / தொலைபேசி / Telephone: 2323022
ෆැක්ස් අංකය / பெக்ஸ் இல. / Fax No.: 2320785

Web Site: www.moj.gov.lk

# අධිකරණ අමාත්‍යාංශය
# நீதி அமைச்சு
# MINISTRY OF JUSTICE

ටෙලිමේල් / Tele / ரெலிமெயில்: අධිකරණ ලේකම් / நீதிச்செயலாளர் / Secminjust
තැ.පෙ. / தபால்பெட்டி / P.O. Box.: 555
ඉලෙක්ට්‍රෝණික තැපැල / மின்அஞ்சல் / E-mail: info@moj.gov.lk
උපරිමාධිකරණ සංකීර්ණය
කොළඹ 12
மீயுயர் நீதிமன்ற கட்டிடத்தொகுதி
கொழும்பு 12
Superior Courts Complex,
Colombo 12.

මගේ අංකය / எனது இல / My No.: MOJ/Media/Release/78

ඔබේ අංකය / உமது. இல. / Your No.:

දිනය / திகதி / Date: 2021.06.14

## <u>මාධ්‍ය නිවේදනයයි.</u>

**<u>ප්‍රවෘත්ති කර්තෘ / අධ්‍යක්ෂක</u>**

අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් අනුව MV -X Press Pearl නෞකාවේ ඇති වූ ගින්නෙන් මෙරටට සිදු වූ බලපෑම හා හානිය සම්බන්ධයෙන් සියලු ක්ෂේත්‍ර ආවරණය වන පරිදි වන්දි ලබා ගැනීම හා ඊට අදාළ නෛතික කටයුතු සිදු කිරීම සඳහා ගරු නීතිපතිතුමාට අවශ්‍ය සහාය ලබාදීම පිළබඳව සාකච්ඡාවක් ගරු අධිකරණ අමාත්‍ය ජනාධිපති නීතිඥ අලි සබ්රි මැතිතුමාගේ ප්‍රධානනත්වයෙන් ගරු වරාය හා නාවික කටයුතු අමාත්‍ය රෝහිත අබේගුණවර්ධන, නාගරික සංවර්ධන වෙරළ සංරක්ෂණ හා අපද්‍රව්‍ය බැහැරලීමේ කටයුතු රාජ්‍ය අමාත්‍ය ආචාර්ය ගරු නාලක ගොඩහේවා, විසිතුරු මසුන් මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම ධීවර වරාය සංවර්ධන බහුදින ධීවර වරාය කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍ය ගරු කංචන විජේසේකර අමාත්‍යවරුන්ගේ හා ගරු නීතිපති ජනාධිපති නීතිඥ සංජය රාජරත්නම් මහතාගේ සහභාගිත්වයෙන් අද දින (2021.06.14) අධිකරණ අමාත්‍යාංශයේදී පැවැත්විණි.

සාකච්ඡාවෙන් අනතුරුව මාධ්‍ය හමුවක් පැවති අතර එහිදී අදහස් දක්වමින් අධිකරණ අමාත්‍යතුමා මෙසේ සඳහන් කළේය.

MV -X Press Pearl නෞකාවේ ඇති වූ ගින්නෙන් මෙරටට සිදු වූ හානිය සම්බන්ධයෙන් වන්දි ලබා ගැනීම සඳහා අදාළ සියලු ක්ෂේත්‍ර ආවරණය වන පරිදි සාකච්ඡා කරමින් සිටින බවත් මේ වන විටත් සිදු වූ හානිය සම්බන්ධයෙන් පළමු අතුරු හිමිකම් පෑමක් ලෙස මැයි මස 23 වැනි දින සිට ජුනි මස 03 වන දින දක්වා දින දහයක කාලය තුළ රජයේ ආයතනවලට වැය වූ වියදම් හා රටට වූ හානිය පිළිබඳව වන්දියක් ඉල්ලා ඇති බවත් අමාත්‍යතුමා පැවසීය.

නෞකාවේ ඇති වූ ගින්නෙන් මෙරට සිදු වූ හානිය සම්බන්ධයෙන් වූ ප්‍රධාන හිමිකම් පෑම වෙනුවෙන් කටයුතු කිරීම සඳහා කමිටු 05 ක් පත් කර ඇති බවත් එම කමිටු ඉතා කඩිනමින් මේ වෙනුවෙන් කටයුතු කරමින් සිටින බවත් මෙහිදී සඳහන් කෙරිනි. එමෙන්ම මෙම ගින්න හේතුවෙන් හානියට පත් බාහිර පාර්ශ්වයන් සඳහා තමන්ට වූ හානිය පිළිඳව දැනුම්දීම සඳහා වෙනම ක්‍රමවේදයක් සකස් කර ඇති බවත් ඒ වෙනුවෙන් වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙකුගේ ප්‍රධානත්වයෙන් යුත් ඒකකයක් ස්ථාපිත කිරීමට පියවර ගෙන ඇති බවත් මෙම සිද්ධියෙන් පීඩාවට පත් ජනතාව සිද්ධිය ඇති වීමට පෙර පැවති තත්වයට ගෙන ඒම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන බවත් අමාත්‍යතුමා වැඩිදුරටත් සඳහන් කළේය.

මේ සම්බන්ධයෙන් මෙරටට සිදු වූ හානිය සම්බන්ධව අදාළ වන්දි ලබා ගැනීම සඳහා ජත්‍යන්තර විශේෂඥ සහාය ලබා ගැනීමට පියවර ගෙන ඇති බවත් එක්සත් ජාතීන්ගේ මෙරට නියෝජිතවරිය සමඟ සිදු කළ සාකච්ඡාවල ප්‍රතිඵලයක් ලෙස ඔවුන්ගේ විශේෂඥයින් තිදෙනෙකු මෙරටට පැමිණීමට නියමිත බවත් අධිකරණ අමාත්‍යතුමා පැවසීය.

නෞකාවේ ඇති වූ ගින්න හේතුවෙන් මෙරට ආර්ථිකයට, පරිසර පද්ධතියට, ධීවර කටයුතුවලට මෙන්ම විවිධ ක්ෂේත්‍රවලට විශාල වශයෙන් බලපෑම් ඇතිව තිබෙන බැවින් ඒ පිළිබඳව කරුණු වාර්තා කිරීමට පසුගිය 06 වැනි දින පැවති සාකච්ඡාවේ දී පත් කළ කමිටු විසින් මීට අදාළව සිදු කර ඇති කාර්යයන් පිළිඳව ද මෙහිදී අවධානය යොමු විය.

මෙම සාකච්ඡාව සඳහා අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් එම්.එම්.පී.කේ.මායාදුන්නෙ, වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් U.D.C. ජයලාල්, නාගරික සංවර්ධන වෙරළ සංරක්ෂණ හා අපද්‍රව්‍ය බැහැරලීමේ රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් ශ්‍රී නිමල් පෙරේරා, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති ජනරාල් දයා රත්නායක මහතා ඇතුළු විවිධ ආයතන නියෝජනය කරමින් රාජ්‍ය නිලධාරීන් එක්ව සිටියහ.

චමිල විජේසේකර - 0773333533
මාධ්‍ය ලේකම්
අධිකරණ අමාත්‍යාංශය